# විශේෂ ව්‍යාපෘති පහසුකම් සපයන්නාගේ අවසන් වාර්තාව

පොදු

ව්‍යාපෘති අංකය: 36173-013
ණය අංක: 2557 සහ 2558
2023 ඔක්තෝබර්

## ශ්‍රී ලංකාව: මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය

(පැමිණිල්ල ලද දිනය: 2019 නොවැම්බර් 22)

ආසියානු සංවර්ධන බැංකුවෙහි තොරතුරු සඳහා පවතින ප්‍රවේශ ප්‍රතිපත්තියට අනුව මෙම ලේඛනය මහජනතාවට අනාවරණය කරනු ලැබේ.

Asian Development Bank

මෙම වාර්තාවේ මුල් ඉංග්‍රීසි පිටපත විශේෂ ව්‍යාපෘති පහසුකම් සපයන්නාගේ කාර්යාලය විසින් සිංහලට පරිවර්තනය කරන ලදී. යම් නොගැලපෙන අවස්ථාවකදී, ඉංග්‍රීසි පිටපත මූලික වනු ඇත.

කිසියම් රටක වැඩසටහනක් හෝ ක්‍රමෝපායක් සකස් කිරීමේදී, ඕනෑම ව්‍යාපෘතියක් මූල්‍යකරණය කිරීමේදී, හෝ මෙම ලේඛනය තුළ යම් නිශ්චිත භූමි ප්‍රදේශයක් හෝ භූගෝලීය ප්‍රදේශයක් සම්බන්ධයෙන් යම් හඳුනාගැනීමක් හෝ යොමු කිරීමක් සිදුකිරීමේදී, ආසියානු සංවර්ධන බැංකුව ඕනෑම භූමියක් හෝ ප්‍රදේශයක් සම්බන්ධයෙන් නෛතික හෝ වෙනත් තත්වයන් පිළිබඳව කිසිදු විනිශ්චයක් කිරීමට අදහස් නොකරනු ලැබේ.

## කෙටි යෙදුම්

| | |
|---|---|
| ආ.ස.බැ. | ආසියානු සංවර්ධන බැංකුව |
| ව.යා. | වගවීමේ යාන්ත්‍රණය |
| කො.ම.න.ස. | කොළඹ මහ නගර සභාව |
| වි.ව්‍යා.ප.ස.කා. | විශේෂ ව්‍යාපෘති පහසුකම් සපයන්නාගේ කාර්යාලය |
| ද.ආ.දෙ. | දකුණු ආසියා දෙපාර්තමේන්තුව |
| ශ්‍රී.ල.නේ.මෙ. | ශ්‍රී ලංකා නේවාසික මෙහෙවර |
| වි.ව්‍යා.ප.ස. | විශේෂ ව්‍යාපෘති පහසුකම් සපයන්නා |

**සටහන**

මෙම වාර්තාවේ "$" යන්නෙන් අදහස් වන්නේ එක්සත් ජනපද ඩොලර් වන අතර "SLRs" යන්නෙන් අදහස් වන්නේ ශ්‍රී ලංකා රුපියල්ය.

# අන්තර්ගතය


| | | | පිටුව |
|---|---|---|---|
| ව්‍යාපෘති කරුණු පත්‍රිකාව | | | i |
| I. | පසුබිම | | 1 |
| | A. | ව්‍යාපෘතිය | 1 |
| | B. | පැමිණිල්ල | 1 |
| | C. | සුදුසුකම් තීරණය කිරීම | 2 |
| II. | සමාලෝචනය සහ ඇගයීම සහ ගැටළු විසඳීම | | 2 |
| | A. | සමාලෝචනය සහ ඇගයීම | 2 |
| | B. | පාර්ශවකරුවන් හඳුනා ගැනීම | 2 |
| | C. | ගැටළු විසඳීම | 2 |
| III. | නිගමනය | | 4 |

**ව්‍යාපෘති කරුණු පත්‍රිකාව**

**ව්‍යාපෘතිය:** මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය

**අනුමත කරන ලද්දේ:** 2009 සැප්තැම්බර් 28

**විස්තරය:** අපජල කළමනාකරණ සේවා වැඩිදියුණු කිරීම තුළින් කොළඹ නගරයේ නාගරික සහ තදාසන්න ප්‍රදේශවල පදිංචිකරුවන් සඳහා නාගරික පරිසරය මෙන්ම මහජන සෞඛ්‍යය තත්වය වැඩිදියුණු කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය (i) පොම්පාගාර, මලාපවහන නල සහ පිටවීම් ඇතුළුව මලාපවහන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට; (ii) වත්කම් කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය, මෙහෙයුම් කාර්ය සාධනය අධීක්ෂණය, පාරිසරික නියාමන අනුකූලතාව, පාරිභෝගික සේවා සහ දිළිඳු ජනතාවට හිතකර සනීපාරක්ෂක සේවා යනාදී කරුණු සම්බන්ධයෙන් ආයතනික සහ මෙහෙයුම් හැකියා ශක්තිමත් කිරීමට; සහ (iii) ව්‍යාපෘති කළමනාකරණය සහ ක්‍රියාත්මක කිරීමට සහාය වනු ඇත.

**ප්‍රතිඵලය:** ව්‍යාපෘතිය අංග තුනකින් සමන්විතය. පළමු අංගය මගින් මහ කොළඹ ප්‍රධාන මලාපවහන පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළුව මලාපවහන යටිතල පහසුකම් වැඩිදියුණු කරනු ඇත. දෙවැනි අංගය යටතේ (i) වත්කම් කළමනාකරණ සැලසුම් සහ මෙහෙයුම්, (ii) මූල්‍ය කළමනාකරණය, (iii) මෙහෙයුම් කාර්ය සාධන අධීක්ෂණය, (iv) පාරිසරික අනුකූලතාව, (v) පාරිභෝගික සේවා සහ මහජන දැනුවත් කිරීම, සහ (vi) දිළිඳු ජනතාවට හිතකර සහ ස්ත්‍රී-පුරුෂභාවය සැලකිල්ලටගත් සනීපාරක්ෂක සේවා යනාදී කරුණු සම්බන්ධයෙන් ආයතනික සහ මෙහෙයුම් හැකියාව ශක්තිමත් කරනු ඇත. තෙවැනි අංගය හරහා අපජල සේවා සපයන්නන්ගේ හැකියා වර්ධනය කිරීමේ පුළුල් වැඩසටහනක කොටසක් ලෙස ව්‍යාපෘති කළමනාකරණය සහ ක්‍රියාත්මක කිරීම වැඩිදියුණු කරනු ඇත.

**පීඩාවට ලක්වූ කුටුම්භ සහ බලපෑම්:** ආසියානු සංවර්ධන බැංකුවේ ස්වේච්ඡාවෙන් තොරව නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තියට (1995) අනුව මෙම ව්‍යාපෘතිය B කාණ්ඩය ලෙස වර්ග කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ සිදුවන යටිතල පහසුකම් කටයුතු සීමා වන්නේ දැනට පවතින භෞතික පහසුකම් තුළ ඇති මලාපවහන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමටය. භූගත මලාපවහන පද්ධතිය (gravity sewers) ප්‍රතිසංස්කරණය කිරීමට අගල් රහිත තාක්‍ෂණය (trenchless technology) හෝ විවෘත කැපීම (opencut) හරහා ඉදිකිරීම් සිදුකරනු ඇත. නිසි ප්‍රවේශයක් නොමැති මාර්ග වලදී, එකී මාර්ග ආශ්‍රිතව පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරවලට සහ ඒවායේ සේවකයන්ට තාවකාලික ආදායම් අහිමිවීමේ හැකියාවක් පවතී. මෙම ව්‍යාපෘතිය සඳහා ස්ථිර හෝ තාවකාලික ඉඩම් අත්පත් කර ගැනීමක් අවශ්‍ය නොවන අතර ස්ථිර ව්‍යුහයන්ට හෝ වෙනත් වත්කම්වලට බලපෑමක් සිදු නොවේ. පාරිභෝගිකයින්ට පවතින ප්‍රවේශය අඩු වීම හේතුවෙන් ඇස්තමේන්තුගත ව්‍යාපාර 428 කට සහ 1,340 පමණ වන සේවකයින්ට අර්ධ ආදායම් අහිමිවීම් සිදු විය හැක.

**ආරක්ෂණ කාණ්ඩ:**

පරිසරය: B
ස්වේච්ඡාවෙන් නොවන නැවත පදිංචි කිරීම: B
ආදිවාසී ජනතාව: C

**මූල්‍ය සැලැස්ම:**

| | | |
|---|---|---|
| ආසියානු සංවර්ධන බැංකුව | සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් | $ මිලියන 80 |
| ආසියානු සංවර්ධන බැංකුව | ආසියානු සංවර්ධන අරමුදල | $ මිලියන 20 |
| ශ්‍රී ලංකා රජය | | $ මිලියන 16.6 |

# I. පසුබිම

## A. ව්‍යාපෘතිය

1. කොළඹ යනු ශ්‍රී ලංකාවේ ආර්ථික හා පරිපාලන මධ්‍යස්ථානයයි. ශ්‍රී ලංකා රජය, එහි 2006-2016 දස අවුරුදු සංවර්ධන රාමුව තුළ, ඉහළ සහ ස්ථාවර ආර්ථික වර්ධනය මෙන්ම අගනගර කලාප නවීකරණය කිරීම යනාදී කාරණා ජාතික ආර්ථික වර්ධනයේ යාන්ත්‍රණය ලෙස ඉලක්ක ගත කරන ලදී. රටේ අගනගර කලාපය සඳහා වන සංවර්ධන සැලැස්ම ලෙස රජය විසින් බස්නාහිර කලාප ව්‍යුහ සැලැස්ම අනුගමනය කරන ලදී. මෙමගින් ජාතික ආර්ථිකය තිරසාරව පවත්වාගෙන යාමට සහ මහ කොළඹ ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා අපජල කළමනාකරණය ඇතුළුව මූලික යටිතල පහසුකම් සහ සේවාවන්හි තීරණාත්මක කාර්යභාරය අවධාරණය කරන ලදී. ආසියානු සංවර්ධන බැංකුව එහි සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් වලින් ඩොලර් මිලියන 80 ක ණයක් සහ ආසියානු සංවර්ධන අරමුදලෙන් ඩොලර් මිලියන 20 ක ණයක් ලබා දෙනු ඇත.

2. මහ කොළඹ නාගරික සහ තදාසන්න ප්‍රදේශවල පදිංචි මිලියන 1.5 ක පමණ ජනතාවට වැඩිදියුණු කල නාගරික පරිසරයක් මෙන්ම යහපත් මහජන සෞඛ්‍යය තත්වයක් ඇති කිරීම මෙම මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතියේ (ව්‍යාපෘතිය) අපේක්ෂිත බලපෑම වේ. මෙම කාර්යය සිදුකරනු ලබන්නේ, සාගර සහ අභ්‍යන්තර ජලයේ ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස සනීපාරක්ෂාව සහ සනීපාරක්ෂක කොන්දේසි වැඩිදියුණු කිරීම හරහාය. ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලය වන්නේ වැඩිදියුණු කරන ලද මලාපවහන යටිතල පහසුකම් සහ සේවා සපයන්නාගේ උසස් ආයතනික සහ මෙහෙයුම් හැකියාවන් තුළින් ව්‍යාපෘති ප්‍රදේශය තුළ සිටින 645,000 ක පමණ පදිංචිකරුවන්ට ලබාදෙන වැඩිදියුණු කල අපජල කළමනාකරණ සේවාවන්ය. මෙම ව්‍යාපෘතියත් සමඟ මහ කොළඹ පදිංචි නාගරික ජනතාවට වඩා හොඳ අපජල කළමනාකරණ සේවාවන් සඳහා ප්‍රවේශය ලැබෙනු ඇත.

## B. පැමිණිල්ල

3. ව්‍යාපෘතියේ ඉදිකිරීම් හේතුවෙන් දේපළ හා සෞඛ්‍ය කාරණාවන්ට සිදුවන බලපෑම් පිළිබඳ චෝදනා එල්ල කරමින් ව්‍යාපෘතිය සම්බන්ධ පැමිණිල්ලක් 2017 අප්‍රේල් 19 වැනි දින විශේෂ ව්‍යාපෘති පහසුකම් සපයන්නාගේ කාර්යාලයට (වි.ව්‍යා.ප.ස.කා.) ලැබිණි. ආසියානු සංවර්ධන බැංකුවෙහි වගවීමේ යාන්ත්‍රණය (ව.යා.) වෙත අදාල පැමිණිල්ල යොමු කිරීමට පෙර, අදාළ ආසියානු සංවර්ධන බැංකුවේ මෙහෙයුම් දෙපාර්තමේන්තුව, දකුණු ආසියානු දෙපාර්තමේන්තුව (ද.ආ.දෙ.) සහ ශ්‍රී ලංකා නේවාසික මෙහෙයුම (ශ්‍රී.ල.නේ.මෙ.) සමඟ සිය ගැටලු විසඳීමට පැමිණිලිකරුවන් ඒවන තෙක් උත්සාහ කර නොතිබූ බැවින්, වි.ව්‍යා.ප.ස.කා විසින් එම අවස්ථාවේදී අදාල පැමිණිල්ල නුසුදුසු පැමිණිල්ලක් ලෙස සලකනු ලැබීය. පැමිණිලිකරුට ඔහුගේ නිවසට ඍජුවම සම්බන්ධ අලුත්වැඩියා කටයුතු සඳහා ඇස්තමේන්තුගත පිරිවැය වෙනුවෙන් ශ්‍රී ලංකා රුපියල් 121,000 ක් 2017 දෙසැම්බර් 5 දින ගෙවා ඇත. කෙසේ වෙතත්, තම මව රෝහල්ගත කිරීමට හේතුව වූයේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු බවට වන පැමිණිලිකරුගේ ප්‍රකාශය ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන කොළඹ මහ නගර සභාව (කො.ම.න.ස.) විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

4. එම පැමිණිලිකරුවන් විසින් වි.ව්‍යා.ප.ස.කා. වෙත සිය දෙවන පැමිණිල්ල 2018 සැප්තැම්බර් 11 දින ගොනු කරන ලදී. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු හේතුවෙන් සිදුවූ බව කියන පවුලේ සාමාජිකයෙකු රෝහල් ගත කිරීම සඳහා ලැබුණු හිමිකම් තක්සේරු කිරීම පිළිබඳ සිය අතෘප්තිය සම්බන්ධයෙන් එකී පැමිණිල්ල යොමු විය.

5. වි.ව්‍යා.ප.ස.කා. විසින් දෙවන පැමිණිල්ලේ සුදුසුකම් නිර්ණය කිරීම සඳහා ලැබුණු ලේඛන සමාලෝචනය කර පැමිණිලිකරුවන් මෙන්ම අදාළ ආ.ස.බැ. ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. වි.ව්‍යා.ප.ස.කා. විසින් කො.ම.න.සභාවෙහි ව්‍යාපෘති අධ්‍යක්ෂ වරයාද හමුවිය. ඒ වන විට, කො.ම.න.ස. විසින් කිසිදු අතිරේක වන්දියක් සලකා බැලීමට හෝ පැමිණිලිකරුවන් සමඟ තවදුරටත් ගැටළු විසඳීමට අකැමති විය. මේ අනුව, එක් පාර්ශ්වයක අනුමැතියකින් තොරව, එනම් කො.ම.න.සභාවෙහි අනුමැතිය රහිතව, වි.ව්‍යා.ප.කාර්යයාලයට අදාල විධිමත් ගැටළු විසඳීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාමට නොහැකි විය. එවැනි තත්වයන් යටතේ මෙන්ම ආ.ස.බැ. හි වගවීමේ යාන්ත්‍රණ ප්‍රතිපත්තියේ සුදුසුකම් අවශ්‍යතා, ඡේද. 138, 142–143, සලකා බැලීමෙන් අනතුරුව, දෙවන පැමිණිල්ල විධිමත් ගැටළු විසඳීමේ ක්‍රියාවලිය සඳහා නුසුදුසු ලෙස 2018 ඔක්තෝම්බර් 9 දින සලකන ලදී[1]. කෙසේ වෙතත්, අතිරේක වන්දි සඳහා වන පැමිණිලිකරුවන්ගේ ඉතිරි ඉල්ලීම් සලකා බැලීමට කො.ම.න.ස. ඒත්තු ගැන්වීම සඳහා සිය කැපවීම නොකඩවා පවත්වාගෙනයාමට අදාල ද.ආ.දෙ. කාර්ය මණ්ඩලය දිරිමත් කරන ලදී.

[1] පැමිණිල්ලේ සුදුසුකම් පිළිබඳ සංදේශයක් 2018 ඔක්තෝම්බර් 9 වන දින ජනාධිපතිවරයා වෙත යවන ලදී.

6. ව්‍යාපෘති කොන්ත්‍රාත්කරුගේ රක්ෂණ සමාගම විසින් ගනු ලැබූ තීරණය මත සිය මව විසින් දරන ලද වෛද්‍ය වියදම් වලින් 75% ක් තමාට ලැබී ඇති බව පැමිණිලිකරු විසින් කො.ම.න.ස. වෙත 2018 නොවැම්බර් මාසයේදී දැනුම් දෙන ලදී. විශේෂ ව්‍යාපෘති පහසුකම් සපයන්නාගේ (වි.ව්‍යා.ප.ස.) නිර්දේශය මත කො.ම.න.ස. විසින් නඩුව නැවත ආරම්භ කරන ලදී. පැමිණිලිකරුවන් සමඟ දුක්ගැනවිලි විසඳීමේ කමිටු රැස්වීමක් 2018 නොවැම්බර් 26 වැනි දින පවත්වන ලදී. ආ.ස.බැ. ව්‍යාපෘති කාර්ය මණ්ඩලය නිරීක්ෂකයින් ලෙස රැස්වීමට සහභාගී විය.

7. පැමිණිලිකරුගේ මවගේ වෛද්‍ය වියදම් වලින් ඉතිරි කොටස වන 25% (ශ්‍රී ලංකා රුපියල් 41,852.33) ගෙවීමට දුක්ගැනවිලි විසඳුම් කමිටුව තීරණය කරන ලදී[2]. පැමිණිලිකරුවන් විසින් යෝජනා කරන ලද පරිදි අලුත්වැඩියා කටයුතු අතරතුර මවගේ විකල්ප නවාතැන් අවශ්‍යතා සඳහා කො.ම.න.ස. විසින් ගෙවිය යුතු බවටද නිර්දේශ කරන ලදී. එකඟ වූ ක්‍රියාමාර්ග කො.ම.න.ස. විසින් ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව පැමිණිලිකරුවන් තවමත් සෑහීමකට පත්වී නොමැත.

8. 2019 නොවැම්බර් 22 දින, පැමිණිලිකරුවන් සිය තෙවැනි පැමිණිල්ල සමඟ වි.ව්‍යා.ප.ස.කා. වෙත නැවත පැමිණ, කො.ම.න.ස. විසින් යෝජනා කරන ලද වන්දි ගෙවීමේ විධිවිධාන සහ ව්‍යාපෘති ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවූ බව කියන මවගේ අදාළ රෝහල්ගතවීම පිළිබඳව තමන් තෘප්තිමත් නොවන බව ප්‍රකාශ කළහ. සිය මව රෝහල් ගත කිරීම සඳහා තමන්ට ගෙවූ මුදලේ යම් විෂමතාවයක් පවතින බවත්, අලුත්වැඩියා කටයුතු සඳහා වන තාවකාලික මුදල් සම්බන්ධයෙන් ගැටලු පවතින බවත්, සිය බලපෑමට ලක් වූ දේපල අලුත්වැඩියා කිරීමට අදාල ඇස්තමේන්තුව සකස් කිරීමට යන වියදම තමන්ට ප්‍රතිපූරණය කර දෙන ලෙසත් පැමිණිලිකරුවෝ ඉල්ලා සිටියහ.

### C. සුදුසුකම් නිර්ණය කිරීම

9. 2012 වගවීමේ යාන්ත්‍රණ ප්‍රතිපත්ති සුදුසුකම් නිර්ණායක මෙන්ම පැමිණිලිකරුවන්ගේ සහ මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ලේඛන සහ තොරතුරු මත පදනම්ව තුන්වන පැමිණිල්ල පරීක්ෂා කිරීමෙන් පසුව, වි.ව්‍යා.ප.ස. එය විධිමත් ගැටළු විසඳීමේ ක්‍රියාවලිය සඳහා සුදුසුකම් ලබා ඇති බව 2020 ජනවාරි 15 වන දින සලකනු ලැබිය.

## II. සමාලෝචනය සහ ඇගයීම සහ ගැටළු විසඳීම

### A. සමාලෝචනය සහ ඇගයීම

10. වි.ව්‍යා.ප.ස.කා. විසින් (i) පැමිණිල්ලේ ප්‍රධාන ගැටළු හඳුනාගන්නා ලදී, (ii) ඒකාබද්ධ ක්‍රමවේදයකට ගැටළු විසඳීම සඳහා පාර්ශ්වකරුවන්ගේ සූදානම මෙන්ම සමතයකට පවතින විකල්ප අධ්‍යයනය කරන ලදී, සහ (iii) ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් නිර්දේශ කරන ලදී. සමාලෝචනය සහ ඇගයීම තුළ ද.ආ.දෙ., ශ්‍රී.ල.නේ.මෙ., කො.ම.න.ස. සහ පැමිණිලිකරුවන් සමඟ සාකච්ඡා ඇතුළත් විය.

### B. පාර්ශවකරුවන් හඳුනා ගැනීම

11. පාර්ශවකරුවන් යටතට (i) පැමිණිලිකරුවන්; (ii) රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය (ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය, කලින් අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ලෙස හැඳින්වූ); සහ (iii) කො.ම.න.ස. ඇතුළත්ය.

12. හඳුනාගත් අනෙකුත් පාර්ශවකරුවන් අතරට ද.ආ.දෙ. සහ ශ්‍රී.ල.නේ.මෙ. යන පාර්ශ්ව දෙකෙන්ම ව්‍යාපෘතියට සම්බන්ධ ආ.ස.බැ. කාර්ය මණ්ඩලයද ඇතුලත් විය.

### A. ගැටළු විසඳීම

13. වි.ව්‍යා.ප.ස.කා. විසින් පැමිණිලිකරුවන්ගේ තෙවැනි පැමිණිල්ල සුදුසුකම් ලබා ඇති බවට 2020 ජනවාරි 15 දින ප්‍රකාශයට පත් කරන ලදී. ඉදිකිරීම් හානි සඳහා තවදුරටත් වන්දි ලැබීමට තමන්ට හිමිකම් ඇති බවට ඔවුහු

---

[2] සිදු කිරීමට නියමිත අලුත්වැඩියා කටයුතු සම්බන්ධයෙන්, පැමිණිලිකරුවන්ගේ ඉල්ලීම මුලින් ප්‍රතික්ෂේප කර ඇති නමුත් අවසානයේ නැවත සලකා බලන ලදී.

චෝදනා කළහ. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු හේතුවෙන් සෞඛ්‍ය තත්ත්වයට බලපෑම් එල්ල වූ බව කියන මව වෙනුවෙන් තවදුරටත් රෝහල්ගත කිරීමේ වියදම් ද ඔවුන් ඉල්ලා සිටින ලදී. අලුත්වැඩියා කටයුතු අතරතුර සිය මවට විකල්ප රෝහල් නවාතැන් අවශ්‍ය බවත්, ඊට අදාළ පිරිවැය කො.ම.න.ස. මගින් ආවරණය කළ යුතු බවත් පැමිණිලිකරු පැහැදිලි කරන ලදී.

14. මවගේ අනාගත රෝහල් වියදම් සඳහා තමන් ඉදිරිපත් කළ ඇස්තමේන්තුවක් මත අදාල මුදල් සෘජුව සහ පූර්ව වශයෙන් තමන්ට ගෙවන මෙන් පැමිණිලිකරුවන් කො.ම.න.ස. වෙතින් ඉල්ලා සිටින ලදී. කෙසේ වෙතත්, පැමිණිලිකරුවන් කියා සිටියේ කො.ම.න.ස. විසින් සිය ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇති අතර කො.ම.න.ස. හි අවසාන ස්ථාවරයවී ඇත්තේ වෛද්‍ය වියදම් දැරීමෙන් පසුව පමණක් අදාල වියදම් සෘජුව රෝහලට ගෙවන බවය. අලුත්වැඩියා කටයුතුවල කාලසීමාව සම්බන්ධයෙන්ද පැමිණිලිකරුට ගැටළු තිබුණි.

15. වි.ව්‍යා.ප.ස.කා. විසින් කො.ම.න.සභා නියෝජිතයන් සමඟ රැස්වීමක් 2020 ජනවාරි 23 දින පැවැත්විය. නීති උපදෙස් අවශ්‍ය වූවහොත් ලබා දීමට ආ.ස.බැංකුවෙහි සාමාන්‍ය නීතිඥ කාර්යාලයේ කාර්ය මණ්ඩලයද රැස්වීමට පැමිණ සිටින ලදී. ආසියානු සංවර්ධන බැංකුවේ ආරක්ෂක ප්‍රතිපත්ති කරුණු පිළිබඳ මග පෙන්වීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ ආරක්ෂක අංශයේ කාර්ය මණ්ඩලයද සහභාගි වන ලදී. ආ.ස.බැ. ව්‍යාපෘති කණ්ඩායමද රැස්වීමට සහභාගී විය. රැස්වීමේදී පහත සඳහන් කරුණු පිළිබඳව සාකච්ඡා කරන ලදී.

- ව්‍යාපෘතිය මගින් දේපළවලට සහ යහපැවැත්මට වන බලපෑම සම්බන්ධයෙන් වන ගෙවීම් සඳහා පැමිණිලිකරුවන්ගේ ඉල්ලීම් සියල්ලම පාහේ දැනටමත් ගෙවා ඇති බව සහ/හෝ කො.ම.න.ස. විසින් අනුමත කර ඇති බව වි.ව්‍යා.ප.ස. සඳහන් කරන ලදී.

- දේපල අලුත්වැඩියාව සහ අදාල මවගේ රෝහල්ගත කිරීම සාර්ථකව නිම කළ පසු රිසිට්පත් ලබාදෙන බවට වන පොරොන්දුව යටතේ ඉතිරි රේඛීය අයිතම සඳහා එකවර ගෙවීමක් වෙනුවෙන් පැමිණිලිකරුවන්ගේ ඉල්ලීම වි.ව්‍යා.ප.ස. විසින් කො.ම.න.ස. නියෝජිතයන් වෙත දැනුම් දෙන ලදී.

- මීට අමතරව, අලුත්වැඩියා කටයුතු සඳහා කො.ම.න.ස. විසින් නියම කර ඇති දින 15 ක කාලසීමාව සඳහා පැමිණිලිකරුවන්ගේ විරෝධය වි.ව්‍යා.ප.ස. විසින් ඉදිරිපත් කරන ලදී. පැමිණිලිකරුවන්ට අනුව, දින 15 ක කාලසීමාව අලුත්වැඩියා කටයුතු සඳහා ඇස්තමේන්තු කාලයක් විය යුතු අතර, සීමාවක් නොවිය යුතුය.

16. කො.ම.න.සභාවේ රෙගුලාසි එවැනි ක්‍රියාවලියකට ඉඩ නොදෙන බැවින් පැමිණිලිකරුට එකවර මුදලක් ගෙවීමට නොහැකි බව කො.ම.න.සභා නියෝජිතයන් පැහැදිලි කරන ලදී. ඇත්ත වශයෙන්ම, කො.ම.න.ස. වැනි රජයේ ආයතනවලට රෝහල්ගත වීමේ වියදම් ලබාදිය හැක්කේ අදාල පුද්ගලයින්, මෙහිදී පැමිණිලිකරුගේ මව, රජයේ රෝහලක ප්‍රතිකාර ලබන විට පමණක් බව කො.ම.න.ස. වැඩිදුරටත් පැහැදිලි කරන ලදී. පැමිණිලිකරුවන් විසින් නිර්දේශ කරන ලද පෞද්ගලික රෝහලක රෝහල්ගත කිරීමට එකඟවීම ඉටුකරලීම සඳහා දැනටමත් තම ආයතනය විසින් මෙම පොදු මාර්ගෝපදේශය ඉක්මවා ගොස් කටයුතු කර ඇති බව කො.ම.න.ස. විසින් වි.ව්‍යා.ප.ස.කා. වෙත පැහැදිලි කරන ලදී. මේ අනුව, කො.ම.න.ස. විසින් එකඟ විය හැක්කේ අදාල වියදම් පසුව සෘජුවම රෝහලට ගෙවීමට සහතිකවීමක් ලබා දීම යන එකගත්වයට පමණක් බව කො.ම.න.ස. පවසන ලදී. රෝහල් ගත කිරීම සඳහා දිනකට ශ්‍රී ලංකා රුපියල් 26,000 ක පමණ වන පැමිණිලිකරු විසින් ලබාදුන් රෝහල් වියදම් ඇස්තමේන්තුව, අදාල රෝහලෙන් කො.ම.න.ස. වෙත ලබාදුන් දිනකට ශ්‍රී ලංකා රුපියල් 9,000 ක් පමණ වන ඇස්තමේන්තුවට වඩා සැලකිය යුතු ලෙස ඉහළ අගයක් ගන්නා බව කො.ම.න.සභාවෙහි නියෝජිතයින් සඳහන් කරන ලදී. සැබෑ වියදම් සඳහා පමණක් ප්‍රතිපූරණය කිරීමට තමන් බැඳී සිටින බව ප්‍රකාශ කිරීමට කො.ම.න.සභාවට පසුබිම්වූ කාරණය මෙය වේ. කො.ම.න.ස. පැවසුවේ ඔවුන් රෝහල් පරිපාලකයින් සමඟ සාකච්ඡා කර ඇති අතර ඇපවීමේ ක්‍රමවේදයකට සහ අදාල වියදම් පසුව සෘජුවම රෝහලට ගෙවීම සම්බන්දව රෝහල් පරිපාලනය එකඟවූ බවයි.

17. අළුත්වැඩියා කිරීමේ කටයුතු සහ රෝහල්ගත වීමේ සම්බන්ධයෙන් කාල සීමාවක් තිබිය යුතු බව කො.ම.න.සභා නියෝජිතයින් සඳහන් කරන ලදී. තවද, අළුත්වැඩියා කිරීම සහ රෝහල්ගත කිරීමේ වියදම් එකඟත්වයෙන් මාස 3 ක් ඇතුළත අවසන් කිරීමට කො.ම.න.සභාවට අවශ්‍ය වේ.

18. වෙනත් ගැටළු සම්බන්ධයෙන්: (i) රෝහල්ගත කිරීම සඳහා පෙර ගෙවූ ශ්‍රී ලංකා රුපියල් 5,250 මුදලේ යම් විෂමතාවයක් ඇති බව කො.ම.න.ස. නියෝජිතයන් විසින් සඳහන් කළ අතර එම මුදල පැමිණිලිකරුට ගෙවීමට කො.ම.න.ස. එකඟ වන ලදී; (ii) අළුත්වැඩියා කටයුතු සඳහා පවතින තාවකාලික මුදල වන ශ්‍රී ලංකා රුපියල් 50,000 සම්බන්ධයෙන් (පැමිණිලිකරුවන්ට දැනටමත් ගෙවා ඇති ශ්‍රී ලංකා රුපියල් 121,000 ට අමතරව), මෙම මුදල තවමත් පවතින නමුත් භාවිතා කල හැක්කේ කො.ම.න.සභාවේ පරීක්ෂකවරයෙකු විසින් අළුත්වැඩියා කටයුතු සිදු කරන අතරතුර පරික්ෂා කර අදාල පිරිවැය ඉක්මවවන බව සහ එකී තාවකාලික මුදල (හෝ එයින් කොටසක්) භාවිතා කිරීමට අවශ්‍ය බව තහවුරු කරන්නේනම් පමණක් බව; සහ (iii) ඇස්තමේන්තුව සකස් කිරීමේ පිරිවැය වන ශ්‍රී ලංකා රුපියල් 57,500 ක මුදල ප්‍රතිපූරණය කිරීම කො.ම.න.සභාවෙහි උසස් බලධාරීන් විසින් තවමත් සලකා බලමින් සිටී. මෙය අලුත්වැඩියා කටයුතු සඳහා ගතවන කාලය ඇස්තමේන්තු කිරීම අරමුණු කරගත් වාර්තාවයි.

19. කො.ම.න.ස. විසින් වි.ව්‍යා.ප.ස.කා. වෙත දැනුම් දුන්නේ ඉහත ප්‍රකාශ තුල අඩංගු වන්නේ කො.ම.න.ස. වෙතින් වන අවසාන පිරිනැමීම (final offer) වන අතර, වි.ව්‍යා.ප.ස.කා. විසින් පැමිණිලිකරුවන් වෙත එය දැනුම් දෙන ලදී. අවසාන පිරිනැමීම ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රතිපත්තිවලට අනුකූල බව පෙනී යන බවද වි.ව්‍යා.ප.ස. විසින් පැමිණිලිකරුවන්ට දැනුම් දෙන ලදී.

20. අවසාන යෝජනාවට පැමිණිලිකරුවන් විසින් එකඟ නොවන ලදී.

21. කො.ම.න.ස. සිය අවසාන පිරිනැමීම ඒකාකාරීව පවත්වා ගෙන ගොස් ඇති අතර පැමිණිලිකරුවන් සමඟ තවදුරටත් ගැටළු විසඳීමේ නිරත වීමට තමන් අකැමති බව වි.ව්‍යා.ප.ස.කා. වෙත දැනුම්දී ඇත.

22. මේ අනුව, පාර්ශ්වයන් එකඟතාවයකට පැමිණීමට අසමත් වීම මෙන්ම වි.ව්‍යා.ප.ස.කාර්යයාලයේ ගැටළු විසඳීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාමට කො.ම.න.ස. දක්වන අකැමැත්ත හේතුවෙන් වි.ව්‍යා.ප.ස.කාර්යයාලයට තවදුරටත් අරමුණුගත කාර්යභාරයක් ඉටු කළ නොහැකි අතර, පැමිණිල්ල වසා දැමීමට සිදුවනු ඇත.

## III. නිගමනය

23. ඉහත කරුණු මත පදනම්ව, තවදුරටත් ගැටළු විසඳීමේ උත්සාහයන් අරමුණුගත නොවන බව වි.ව්‍යා.ප.ස. තීරණය කරන ලදී. වි.ව්‍යා.ප.ස. විසින් මෙම ක්‍රියාවලිය අවසන් කර පැමිණිල්ල වසා දමනු ඇත. වි.ව්‍යා.ප.ස. විසින් ණය ගැනුම්කරුට, ආ.ස.බැ. ව්‍යාපෘති කණ්ඩායමට, සහ පැමිණිලිකරුවන්ට සිය නිගමනය පිළිබඳව දැනුම් දෙන ලදී.